# පාසල් ව්‍යාපෘති

පාසලක් තුළ වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන සැලසුම් දෙකක් පවතී එනම් පාසැල් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ සංවර්ධන සැලැස්ම හා පාසැල් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ පරිපාලන සැලැස්ම යන දෙකයි මෙම සැලසුම් දෙකම සැබවින්ම ක්‍රියාත්මක කරනුයේ ව්‍යාපෘති වශයෙන් වන අතර යෝජනාවක් ක්‍රියාවට පරිවර්තනය වන්නේ ව්‍යාපෘතියක් ලෙසය.

## ව්‍යාපෘතියක් යනු කුමක්ද?

ව්‍යාපෘති සම්බන්ධව විවිධ ආයතන හා විවිධ කතෘවරු විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. මෙහිදී එම සියලුම නිර්වචන සාකච්ඡා කිරීමට අපේක්ෂා නොකරන අතර සමස්තය පිළිබඳ දළ අවබෝධයක් ලබා දීමට ප්‍රමාණවත් වේ යැයි සිතන නිර්වචන කිහිපයක් පමණක් ඉදිරිපත් කෙරේ.

එය අනන්‍ය නිෂ්පාදනයක් හෝ සේවාවක් ජනනය කිරීම සඳහා වූ තාවකාලික උත්සාහයකි

ආයතනයක අවශ්‍යතා සම්පූර්ණ කිරීම
උදෙසා යම් ප්‍රතිඵල නිෂ්පාදනය කිරීමේ
අටියෙන් නිශ්චිත ආරම්භයක් සහ
අවසානයක් සහිත සංවිධානාත්මකව
ක්‍රියාවට නංවනු ලබන එකට සම්බන්ධ වූ ක්‍රියාකාරකම් සමූහයකි.

අපි සාමාන්‍යයෙන් සිටින පරිදි යම් විශේෂිත කාල පරාසයක් තුළ ප්‍රතිඵල නිපදවන ප්‍රාග්ධන වත්කම් බිහි කරන මූල්‍ය සම්පත් වියදම් කරන ආයෝජන ක්‍රියාකාරකමක් කාරමික ව්‍යාපෘතියක් ලෙස අර්ථ දැක්වේ.

යම් අරමුණක් හෝ අරමුණු මාලාවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීමේ අටියෙන් සීමා සහිත වූ මූල්‍ය මානව හා භෞතික සම්පත් යොදා ගනිමින් යම් නිශ්චිත කාල පරාසයක් තුල ක්‍රියාවට නංවනු ලබන ඒකාබද්ධව ක්‍රියාකාරකම් සමුදායකි

යම්කිසි ආයතනයක පැවතිය යුතු යැයි අපේක්ෂිත මට්ටම සහ පවතින මට්ටම අතර වෙනස පියවීම උදෙසා සිදුකරනු ලබන ක්‍රියාකාරකම් සමුදාය ව්‍යාපෘතියකි

ව්‍යාපෘතියක් යනු විශේෂිත ආරම්භයක් සහ අවසානයක් මෙන්ම සම්බන්ධීකරන හා කළමනාකරණය කරන ලද ක්‍රියාකාරකම් සහිත ඉල්ලුමක් සපුරාලීම සඳහා ඉලක්කයක් ඉටුකරගැනීමට සීමා සහිත වූ කාලයක් අන්තර්ගත පිරිවැය හා සම්පත් යොදා ගන්නා වූ අනන්‍ය ක්‍රියාවලියකි.
ඉහත සඳහන් නිර්වචන සියල්ල විමසා බලන කල ව්‍යාපෘතියක දැකිය හැකි මූලික ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමට පුළුවන.
ව්‍යාපෘතියක් නිර්මාණය වන්නේ නියමිත කාලයක් සඳහා පමණකි සමාජ අවශ්‍යතාවක් ඉටු කරදීමට උත්සාහ කරයි මෙය ආයෝජන ක්‍රියාවලියකි මූල්‍ය සම්පත් රැසකින් යුත් වැඩපිළිවෙළකි නිශ්චිත සංවර්ධන අරමුණක් තිබිය යුතුය යම් ප්‍රතිපත්ති කරුණා නුව ක්‍රියාත්මක වේ සියලු පිරිවැය ගැන අවධානය යොමු කොට ඇස්තමේන්තු සකස් වියයුතුය ක්‍රියාවලිය අවසාන වූ විට ව්‍යාපෘතියද අවසන්වෙයි පැවැත්ම තාවකාලිකය නිශ්චිත නිමැවු බලාපොරොත්තුවේ යොදාගත හැකි සම්පත් ප්‍රමාණය සීමාසහිතය සංවර්ධන ඉලක්කයක් ඉටුකරගැනීමට උත්සහ කරයි සමාජ ආර්ථික ගැටලුවකට විසඳුම් සොයා බලයි ක්‍රියාවට නැංවීම සඳහා සරල පැහැදිලි ක්‍රියාකාරකම් යෝජනා කරයි මේ අනුව ගැටලුවක් විසඳීම සඳහා දුනාගනු ලැබූ යෝජනාවලියක් නැතුව උපායමාර්ගයක් ක්‍රියාත්මක තත්වයට පරිවර්තනය කිරීම සඳහා දරනු ලබන ප්‍රයත්නයකි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ව්‍යාපෘතියක් යනු ප්‍රායෝගික මෙන්ම තාත්වික වූ ප්‍රයත්නයකි ප්‍රයත්නයෙන් හඳුනාගත් ගැටලුවක් සාර්ථක ලෙස විසඳීමට උත්සාහ කෙරේ ව්‍යාපෘතියේ ඇති ප්‍රායෝගික ස්වභාවය මේ අනුව හඳුනාගත හැකිය.

# ව්‍යාපෘති ප්‍රවේශය යොදා ගත හැකි අවස්ථා මොනවා ද?

**අලුත් දෙයක් නිර්මාණය කිරීමේ දී**

නව ඉල්ලුමක් සඳහා නව නිර්මාණ නිපැයුම් ඉදිරිපත් කිරීමේදී ව්‍යාපෘති ප්‍රවේශය යොදා ගත හැකිය .කුමන හෝ අංශයක් ඳහා ඉදිරිපත් කරනු ලබන දෙයක් විය හැකිය. උදාහරණයක් ලෙස කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීම සඳහා හඳුන්වා දෙන ක්‍රමවේදයන් නව ක්‍රමයට වී වගා කිරීම හරිතාගාර ක්‍රම යන්ත්‍ර සූත්‍ර මගින් අස්වනු නෙලීම ආදිය පෙන්වා දිය හැකිය.

**සමාජයේ පවතින ගැටලුවක් විසඳීමේ දී**

පවතින ගැටලුවක් විසඳීම සඳහා ව්‍යාපෘති ප්‍රවේශය යොදා ගැනීමට හැකියාව ඇත. මෙය ග්‍රාමීය මෙන්ම නාගරික සමාජය තුළ පවතින ගැටළුවක් විය හැකිය .එමෙන්ම එය සෞඛ්‍ය අංශයේ සනීපාරක්ෂාව සම්බන්ධව අධ්‍යාපන අංශයේ එසේත් නැතිනම් ආර්ථික වශයෙන් හෝ සමාජයීය වශයෙන් විවිධ මට්ටමේ ගැටලුවක් විය හැකිය.

**සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීමේ දී**

සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දැනුම ලබා දීමේදී ව්‍යාපෘති ප්‍රවේශය යොදා ගත හැකිය විවිධ මට්ටම් වල රාජකාරි කරන නිලධාරීන් සඳහා රටේ සංවර්ධන ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමේදී අවශ්‍ය දැනුම ලබා දීමේදී ඔවුන්ගේ හා ධාරිතා ප්‍රවර්ධනය කිරීමේදී යොදාගත හැකිය. උදාහරණයක් ලෙස පරිපාලන සේවා නිලධාරීන් සඳහා පවත් ලබන ධාරිතා සංවර්ධන වැඩසටහන් බර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා රබර් සංවර්ධනය සඳහා කුසලතා සංවර්ධනය වැඩසටහන් ගුරුවරුන් සඳහා පවත්වනු ලබන විවිධ ධාරිතා සංවර්ධන වැඩසටහන් ආදිය

**සේවාලාභීන් පිළිබඳව වැඩි තොරතුරු ලබාගැනීමේ දී**

සේවාලාභීන් පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමේදී ව්‍යාපෘති ප්‍රවේශය යොදා ගැනීමේ හැකියාව ඇත මෙහිදී අවධානයට ලක්කර ලබන්නේ පර්යේෂණ ව්‍යාපෘතිය ආයතනයක සේවාලාභීන්ගේ තෘප්තිමත්භාවය සොයා බැලීම සංවර්ධන ක්‍රියාවලියේ දී ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න සොයා බැලීම නිම කරන ලද ව්‍යාපෘති හෝ සංවර්ධන වැඩසටහන් වල සඵල දායකත්වය සොයාබැලීම අධ්‍යාපන කටයුතු සඳහා කරන ලද පර්යේෂණ ආදී සෑම වර්ගයකම පර්යේෂණ සිදු කිරීමේදී ව්‍යාපෘති ප්‍රවේශ යොදාගත හැකිය.

**යම් ආයෝජනයක් කිරීමේ දී**

තමන් සතුව ඇති මුදල් යෝජනයක් සිදු කිරීම සඳහා අපේක්ෂා කරන විටදී එම මුදල් ඉහත සඳහන් කළ ඕනෑම අවස්ථාවකදී ආයෝජනය කිරීම සඳහා ව්‍යාපෘති ප්‍රවේශය යොදා ගත හැකිය.
ඒ අයුරින් ඉහත සඳහන් කළ විවිධඅවස්ථා වල දී ව්‍යාපෘති ප්‍රවේශය යොදා ගත හැකි හැකි බව පැහැදිලි වේ.

## ව්‍යාපෘතියක ප්‍රධාන ලක්ෂණ මොනවා ද?

**අරමුණු**
ප්‍රතිලාභීන්ට ලබාදීමට බලාපොරොත්තු වන ප්‍රතිඵල පිළිබඳ අවධානය යොමු කරමින් අරමුණ ගොඩනගා ගත යුතුය.

.

**විශේෂිත වූ කාලපරාසයක් තිබීම**

සෑම ව්‍යාපෘතියක්ම එහි නිමැවුම් ජනනයට අවශ්‍ය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා යම් නිශ්චිත කාලසීමාවක් ගනී .එමනිසා ව්‍යාපෘතියක කාල සීමාව පැහැදිලිව හඳුනා ගත යුතුය .එය ව්‍යාපෘතියෙ පරිමාණය වර්ගය හා ක්‍රියාකාරකම් මත තීරණය වේ.

**ක්‍රියාකාරකම් සමූහයක් තිබීම**
ව්‍යාපෘතියක කායීයන් ක්‍රියාකාරකම් සමගාමී ක්‍රියාකාරකම් සහ ශ්‍රේණිගත ක්‍රියාකාරකම් තිබේ ඒවා පැහැදිලිව හඳුනා ගැනීම අවශ්‍ය වේ .

**ප්‍රතිලාභීන**

යෝජිත ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන කණ්ඩායම ප්‍රතිලාභීන් වේ ශ්‍රී වූ සහ වාක්‍ය කොටස් දෙකක් වූ වන අතර ව්‍යාපෘතියේ මෙම දෙකොටසම පැහැදිලිව හඳුනා ගත යුතුය.

**විවිධ සම්පත්**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා විවිධ වූ සම්පත් භාවිත කිරීමට සිදු වේ මෙය මූලික වශයෙන් මූල්‍ය සම්පත්
මානව සම්පත් (පුහුණු /නුපුහුණු) හා
භෞතික සම්පත් (යන්ත්‍රසූත්‍ර ,ඉඩකඩම්, යාන වාහන) වශයෙන් කොටස් තුනකි .මේ සියලුම සම්පත් වල අවශ්‍යතාව හා පැවැත්ම සොයා බලා ලයිස්තු ගත කළ යුතුය.
ඉලක්ක කණ්ඩායම හෝ ප්‍රතිලාභීන්

ස්ථානය ආදිය පෘතියක ප්‍රධාන ලක්ෂණ වේ.

## ව්‍යාපෘතියක අදියර මොනවා ද?

ව්‍යාපෘති චක්‍රය අනුව
හඳුනාගැනීම
සකස් කිරීම
තක්සේරු කිරීම
ක්‍රියාත්මක කිරීම
ඇගයීම
යන අදියර ව්‍යාපෘතියක අදියරවලට අයත්ය.
එසේම

හඳුනාගැනීම
සකස් කිරීම
ක්‍රියාත්මක කිරීම
නියාමනය
විවරණය
ඇගයීම

ආදිය ඇතුළත්ව ක්‍රියාත්මක කිරීමේදී නියාමනයක් විවරණයක් නැවත ක්‍රියාත්මක කිරීමත් අනතුරුව ඇගයීමක් සිදු කෙරේ.

## ව්‍යාපෘතිය හඳුනාගැනීම

අවශ්‍යතා මත පදනම්ව
සම්පත් මත පදනම්ව
වෙළෙඳපොළ මත පදනම්ව ව්‍යාපෘතිය හඳුනා ගැනීම සිදු කළ හැකිය.

## ව්‍යාපෘති සකස් කිරීම

සක්‍යතා අධ්‍යයනය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීම මගින් ව්‍යාපෘතියක් සකස් කිරීම සිදු කළ හැකිය. එහිදී ව්‍යාපෘතිය සැලසුම් කිරීම ව්‍යාපෘති යෝජනා ලිවීම සිදු කෙරේ.

## ව්‍යාපෘති තක්සේරුව

ව්‍යාපෘති යෝජනාව අරමුදල් ලබා දීමට හෝ අනුමැතිය ලබා දීමට සුදුසු මට්ටමේ පවතිනවා ද යන්න පරීක්ෂාකර බැලීම ඒ මගින් සිදුවේ

## ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම

ව්‍යාපෘති යෝජනාව ක්‍රියාවටපරිවර්තනය කිරීම හා ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමයි .ව්‍යාපෘති මෙහෙයවීම යනු ඉලක්ක හඹා යෑමේ අභ්‍යාසයකි. ඌනතා විමසා බලමින් හේතුසාධක සොයා බලමින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සිදුකරමින් අපේක්ෂිත අරමුණු සඳහා ව්‍යාපෘතිය මෙහෙයවීම සිදු කෙරේ.

### ව්‍යාපෘති ඇගයීම

ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී ඇත්ද? යන්න සොයා බැලීම ව්‍යාපෘතිය ඇගයීමයි. කුමක් සිදුවී ඇත්ද? ප්‍රතිඵලය කෙබඳු ද? සිදුවී ඇති වැරදි මොනවාද? එසේ වීමට හේතු කුමක්ද ? ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? උගත හැකි පාඩම් මොනවාද? විමසමින් කාර්යක්ෂමතාව සඵල දායකත්වය හඳාළ බව මුලින් නොදුටු ප්‍රතිඵල හා තිරසාර බව විමසා බැලීම ඇගැයීමේ දී සිදු කෙරේ. පූර්ව ගයීමක් හෙවත් පෙර ඇගයීමක් ද කරන අතරතුර දී ඇගැයීම ද පශ්චාත් හෙවත් පසු ඇගයීම ද ඉහත කරුණු ඉටු කරගැනීමට කළ හැකිය.

## ව්‍යාපෘති යෝජනා ලිවීම

**ව්‍යාපෘතිය යෝජනා ලිවීමේ පරමාර්ථ මොනවා ද?**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට ආධාර ආයතනවලට ඉදිරිපත් කිරීමට, ව්‍යාපෘතිය අනුමත කර ගැනීම පිණිස අනුමත කිරීමේ ආයතනවලට ඉදිරිපත් කිරීමට සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාමට තාක්ෂණික සහය අවශ්‍ය විටදී ඒවා ලබාගැනීමට ව්‍යාපෘති යෝජනා ලිවිය යුතුය.

## ව්‍යාපෘති යෝජනා ලිවීමේ වැදගත්කම කුමක්ද?

පෞද්ගලිකව තමන් යම් කාර්යයක් කර ගැනීමට අවශ්‍ය වූ විටදී මේ මගින් එම අවශ්‍යතාව ඉටු කර ගත හැකිය.
ආයතනික වශයෙන් අවශ්‍ය සංවර්ධන කටයුතු කරගෙන යෑමට බාහිර සංවිධානයකින් මුදල් ලබාගැනීමට අවශ්‍ය වන්නේ නම් ව්‍යාපෘති යෝජනාවක් වීම අවශ්‍ය වේ .එමෙන්ම එය මාර්ගෝපදේශකයක් සැලැස්මක් ලෙසද යොදා ගත හැකිය.
රටක් වශයෙන් බලන කල ආර්ථික සමාජීය හා පාරිසරික අංශයන්ගේ සංවර්ධන කටයුතු පවත්වාගෙන යාමට ව්‍යාපෘති යෝජනා ලිවීම අවශ්‍යය.

සෑම ව්‍යාපෘතියක් සඳහා ම අවශ්‍යයෙන් ම තිබිය යුතු මූලිකාංගයක් ලෙස විශේෂ අරමුණු හඳුනා ගත හැකිය මෙම අරමුණු නිශ්චිත කරගත් අරමුණුය. සුවිශේෂී අරමුණු අභිමතාර්ථ හා අරමුණුවලින් පැහැදිලිවම වෙනස් විය යුතුය. මේ වෙනස දැකිය හැකි ආකාරයට සුවිශේෂී ලෙස අරමුණු ලිය දැක්වීම කිසියම් පිළිවෙළකට කළ යුතු බව ඩේවිඩ් ඒ විල්සන් ඔහුගේ තොරතුරු කළමනාකරණය නැමැති කෘතියෙන් අවධාරණය කළ අතර අරමුණු ලිවීමේදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන කරුණු පහක් හඳුන්වාදෙයි. ඒය smart සංකල්පය ලෙස හැඳින්වේ .

එනම්

සුවිශේෂී බව

මිනිය හැකි බව

සාධනය කරගත හැකි බව

යථාර්ථවාදී බව

කාලය

යන කරුණු පහ මින් ප්‍රකාශ වේ.

එවැනි අරමුණක් ලියන අයුරු විමසා බලමු.

**2021 වර්ෂය තුළ 7 - 8 ශ්‍රේණිවල සිසුන් අතරින් සිංහල විෂය සාධනය දුර්වල සිසුන්ගේ සාධන මට්ටම 65%සිට 75% දක්වා සියයට 10% කින් වර්ධනය කිරීම**

ඉහත දැක්වෙන අරමුණෙහි මුලින් සඳහන් කළ කරුණු පහම අන්තර්ගත වී ඇති අයුරු විමසා බලමු කාලය නිශ්චිත ය 2021 වර්ෂය තුළ යනුවෙන් පැහැදිලිව ප්‍රකාශ වී ඇත ඉටු කිරීමට අපේක්ෂිත කාර්ය නිශ්චිතය සිංහල විෂය සාධනය වර්ධනය කිරීමයි රමාණය ඉතා පැහැදිලිව ප්‍රකාශ කොට ඇත සාධන මට්ටම ...,.65 % සිට 75% දක්වා ඉහළ මට්ටමට ගෙන ඒමයි කුමන සිසුන් සඳහා ද යන්න කියා සිටි 7 8 ශ්‍රේණිවල සිසුන් සඳහා පමණකි මේ අනුව ඉටු කිරීමට බලාපොරොත්තු වෙන දේ නිශ්චිතය ඉතා සුවිශේෂී බව රැකගෙන ඇත මිනුම් කළ හැකි ලෙස අරමුණ ලියා දක්වා තිබේ හැකි දෙයකි මනෝරාජික සිතුවිල්ලක් නොවේ අධිතක්සේරුවක් දැකිය නොහැකිය යථාර්ථයකි ඉටු කරගත හැකිය කාලය නිශ්චිතව පැහැදිලි ව දක්වා ඇත

## ව්‍යාපෘති චක්‍රය

සෑම ව්‍යාපෘතියක්ම අවස්ථා 06කින් යුත් ජීවන චක්‍රයක ගමන් කරයි.ඒ නම්

1. අවශ්‍යතා තක්සේරුව
2. ව්‍යාපෘතිය හඳුනාගැනීම
3. ව්‍යාපෘතියේ යෝග්‍යතා පිරික්සුම
4. ව්‍යාපෘතිය සැලසුම් කිරීම
5. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
6. ව්‍යාපෘතිය ඇගයීම යනුවෙනි.

## සම්මත ව්‍යාපෘති යෝජනාවක අන්තර්ගගත විය යුතු කරුණු

1.මාතෘකාව/ ගැටළුව

2.හැඳින්වීම

3.අරමුණු

4.භෞතික හා මානව සම්පත්

5.ප්‍රතිලාභ ලබන අය

6.ව්‍යාපෘතියෙ පිරිවැය

7.කාල රාමුව

8.නිර්දේශය හා අනුමත කිරීම

9.ඇමුණුම්

## සම්මත ව්‍යාපෘති  වාර්තාවක ඇතුළත් විය යුතු කරුණු

01.මාතෘකා පිටුව

02.පටුන

03.ස්තුතිය

04.සාරාංශය

05.හැඳින්වීම

06.අරමුණු

07.ප්‍රතිලාභ ලබන්නන්

08.භාවිත සම්පත්

09.ක්‍රියාත්මක කරන ආකාරය

10.කාල රාමුව

11.යෝජනා

12.ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

13.ඇමුණුම්

එච්.එම්.ටී.කේ. දසනායක

කථිකාචාර්ය,

ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ජයවර්ධනපුර